## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. කළමනාකරණ සහකාර තනතුර (තාක්ෂණික නොවන) - MA 1.1 (III ශ්‍රේණිය)**

*සුදුසුකම්* : බාහිර අයදුම්කරුවන් සඳහා ඃ

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමර්ථයන් සහිත ව විෂයයන් හයක් සමත් ව තිබීම;

*සහ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් සමත් ව තිබීම;

*සහ*

ප්‍රාථමික මට්ටම - ශිල්පීය හෝ ශිල්පීය නොවන සේවා කාණ්ඩ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්ද.

වැටුප් පරිමාණය : MA 1.1 - රු. 27,910- 10x300- 7x350- 4x495- 20x660- රු. 48,540-
(ආරම්භයේ දී රු. 27,910 හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරගකාරි විභාගයක් සහ වෘත්තීයවේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

*වෙනත් ප්‍රතිලාභ ඃ*

- සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් මූලික වැටුපෙන් 12% ක හා 3% ක දායකත්වයක් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.
  (සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය මූලික වැටුපෙන් 10% කි)
- සාමාජිකයා හා ඔහුගේ ළඟම පවුලේ සාමාජිකයින් සඳහා දායකත්ව සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- ආසන්නම නගර සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දෙනු ලැබේ. (කඩුවෙල/කොට්ටාව)

අයදුම් කරන පිළිවෙල ඃ

ඥතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, අදාළ සහතිකවල පිටපත් සහිත ව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට **2023 දෙසැම්බර් මස** 18 වැනි දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. කිනම් තත්ත්වයක් යටතේ වුව ද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

එම්.ඩී.එච්. ජයවර්ධන මාවත අතුරුගිරිය.
දුරකථනය : 011-2770232

12-332/1